




සහන් වීරසේකර

# ලාංකීය FM රේඩියෝ කලාවේ සැගවුණු පුරෝගාමී නියමුවා ....
# කියවලා...අහන්න ...මෙතැන් සිට ඔබ අමතන මා කේ. ඩී. කේ.



ගිය අගහරුවාදා එඩ්වඩ් අයියා මට මුණ ගැහුනේ හරිම අහම්බෙන්. ඒ මෙල්බන් නගරයේ. මොහොතකට අතීතයට ගිය බුද්දකගේ හිත නතර වුනේ කේ. ඩී. කේ. ලග. එඩ්වඩ්ට ඔහු ලියු එකම සහ අවසන් ගීතය එයම විය. කාලය වේගයෙන් ගලා ගොස් ඇත. ඒ ගෙවූ කාලය වේගයෙන් ගලා ගියේ කෙසේ දැයි නොදනිමි. එහෙත් එය එසේ සිදුවී ඇත. මෙතෙක් කල් මම නුඹට මහත් සේ ආදරය කළෙමි. දැන් ඒ මතකයෙහි ඉතිරි ව ඇත්තේ ශේෂ වූ නටඹුන් පමණි. ඔබ සොයා යමි. කවුද ලොවට අමතක වූ කේ. ඩී. කේ.

**දවසින් දවසට කොළයෙන් කොළයට**
**කොළ අඩුවෙනවා දින දසුනේ**
**මොහොතින් මොහොතට මා ගැන සටහන්**
**වියැකී යනවා ඔබ මනසේ**

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සහකාර පුස්තකාල කළමනාකරු ලෙස තමා කේ. ඩී. කේ. මුලින්ම ඔහුගේ වෘත්තිය ජීවිතය අරඹා තියෙන්නේ. ඒ අතර එකල පළ වූ සිංහල බෞද්ධයා පත්‍රයේ ලේඛකයකු ලෙස ද කටයුතු කර ඇති කේ. ඩී. කේ. පසුව සිය පුස්තකාල කළමනාකාර රැකියාව සඳහා කොළඹ විශ්ව විද්‍යාලයට මාරුවීමක් ලබාගෙන පැමිණෙන්නේ හුදෙක්ම තම බලාපොරොත්තුවක් වූ ගුවන් විදුලියට සම්බන්ධ වීමට වැඩිපුර අවස්ථාව ලබා ගැනීමට ය. කවුද ලොවට අමතක වූ කේ. ඩී. කේ.

**කුමරියක පා සළඹ සැලුනා...**
**වසා සිටි නෙතු පියන් ඇරුනා...**
**කුමර බඹසර අසපුවේ මා...**
**සම වැදී උන් දැහැන් බිඳුනා..**

පණ්ඩිත් අමරදේවයන්ට කේ. ඩී. කේ. ලිවුවා. මා විශ්වාස කරන අන්දමට මෙය හුදෙක් පුරුෂයකුගේ සිතෙහි ස්ත්‍රියක කෙරෙහි ඇතිවන ලෞකික, ලිංගික, කෙලෙස් සහිත වූ සිතිවිලි සහ එබඳු සිතුවිලි සන්සුන් වූ දිවිය අවුල් කරන ආකාරයත් ඉදිරිපත් කිරීමකි. මෙහි ශාරීරික එක්වීමක් පිලිබඳ නොදක්වයි. හුදෙක් මානසික සිතුවිලි පමනක් දක්වයි යන්න මාගේ මතයයි. කේ. ඩී. කේ. භාෂාවේ සැබෑ හර පද්ධති වටහා ගත් බව මනා පසක් වේ. කවුද ලොවට අමතක වූ කේ. ඩී. කේ.

**අප එකම ලොවේ එක ම දෙසේ ඉන්නේ**
**ඇයි සිතින් එකම අරමුණ නැත්තේ**
**සැප දුක ද ලොවේ එක ම ලෙසේ කැරකේ**
**ඇයි තැවී හඬා සුසුම් හෙළන්නේ...**

ඔහුගේ ගේය පද වලට ඩේසි අක්කාද ගැයුවාය. යොවුන් ප්‍රේමයේ මිහිරියාව විවිධ පැතිකඩ ඔස්සේ විග්‍රහ කෙරෙන ඉහත ගී සමුච්චියක හිමිකරුවා ප්‍රවීණ ගී පද රචක ගුවන් විදුලි නිවේදක කේ. ඩී. කේ. ධර්මවර්ධනයන්ය. ගුවන් විදුලි ගී ද සමගින් වෙළඳ ගී තැටි හා පසුව නිකුත් කෙරුණු කැසට් පට සඳහා ලියෑවුනු වඩාත් ප්‍රේමණීයත්වය ඔපවත්වූ ශෘංගාරාත්මක ගී පෙළහි හරි අඩකඩ ත් වඩා වැඩි තරමක ගී සංඛ්‍යාවක හිමිකරුවන් වූ කරුණාරත්න අබේසේකර ප්‍රේමකීර්ති ද අල්විස් දෙපොළ අතරට තෙවනුව ඇතුළත් විය යුත්තේ කේ. ඩී. කේ. ගේ නාමයයි මට සිතේ.

**ආදරයේ මිහිර රැඳී**
**වියෝගයේ සුසුම් මැකී**
**සෙනේහයේ සුවය රැඳී**
**මහද පැසේ පැතුම් පිරී**

**අතීතය බොරළු තලා**
**පිනට ඔබේ සැගවීලා**
**තුෂාරයේ සිහිල වෙළා**
**දිය දහරා මතු වීලා...**

කේ. ඩී. කේ. ගේ නිවේදන කලාවට බෙහෙවින්ම කැමැති කෙනෙකු තමා අපේ තාත්තා. බුද්දක පුත්‍ර, රනිල් මල්ලවාරච්චිට දුරකථනයෙන් කතා කලා, රනිල් අතීතය සිහිපත් කලා. "අපේ තාත්තා තමයි කේ. ඩී. කේ. අංකල් මුලින්ම ගීතයක් රචනා කලේ. ගැයුවේ. පළමු ගීතය එතරම් ජනප්‍රිය නොවූ නිසා ගී රචනාවෙන් ඈත් වන්නට කේ. ඩී. කේ. ට සිතිනි"

**රනිල් පුතේ හිනැහෙන්**
**සුපුන් සඳක් විලසින්**
**රනිල් පුතේ හිනැහෙන්**
**පිපෙන පියුම විලසින්...**

එකල එය එතරම්ම සාර්ථක ගීතයක් නොවුණු නිසා ගී පද රචනයට කේ. ඩී. කේ. අංකල් උදාසීන වෙලා ටික කාලයක් ඉන්න කොට අපේ තාත්තා (මිල්ටන්) නැවතත් බලකර තියෙනවා ඔහුට ගීතයක් ලියන්න කියලා." ඒ නිසා ලියු දෙඅදර විලිකුන් සුරත් පලේ ගීතය සාර්ථක නිර්මාණයක් වීමත් සමග තමයි කේ. ඩී. කේ. සෘජුවම ගී පද රචනයට පිවිසී තියෙන්නේ. කවුද ලොවට අමතක වූ කේ. ඩී. කේ.

**සයුරෙහි පාවී වෙන් වී ගියේ**
**ඔබ ළග රන්දා මගේ ආදරේ...**

**දිනකර දවාලයි දවස පුරා මා**
**හිමකර නැගේ මුදු සිසිල සලා**
**දවස පුරා හෝ මුළු රැය පුරා හෝ**
**ඔබ මා හදේ යාවේ සුසුම් ලෙසේ...**

කේ. ඩී. කේ. සතුව පැවති ප්‍රතිභාව ඔහුට සහජයෙන්ම උරුම වූ අසාමාන්‍ය ප්‍රතිභාවක් ලෙසයි මට හැගෙන්නේ. සහජයෙන් ගී පද රචකයකු වුණා වගේම මහනුවර ධර්මරාජ විදුහලෙන් මල්වතු විහාරයේ වෑඋඩ දේවමිත්‍ර නායක ස්වාමින් වහන්සේගෙන් සිංහල, පාලි සහ සංස්කෘත භාෂා හැදෑරීමෙන් උපමා රූපක යොදමින් බස හැසිරවීමට ද කේ. ඩී. කේ. වඩාත් පරිණත වී තිබෙනවා. පණ්ඩිත් අමරදේවයන් වෙනුවෙන් ගී පද රචනය කළ යුතු ආරත් මිල්ටන් මල්ලවආරච්චි වෙනුවෙන් ගී පද රචනය කළ යුතු ආරත් අතර වෙනස තේරුම් අරගෙන සාර්ථකව නිර්මාණකරණයේ නියැලෙන්න කේ. ඩී. කේ. ට පුළුවන් වුණේ භාෂා පිළිබඳ ඔහු සතු එම පරිණතභාවය නිසා යි.

**අප එක පෙදෙසක**
**නිවසන්නේ**
**නැතුව ද ඔබ මා**
**හඳුනන්නේ...**

**මා දිහා...**
**ඇයි නොබලන්නේ**
**ඇයි නොබලන්නේ...**

මිල්ටන් දැඩිව ගිලන්ව පුද්ගලික රෝහලක සිටියදී කේ. ඩී. කේ. ඔහු බලන්න ගිය විට මිල්ටන්ගේ ඇසින් වැටි කඳුළු පොදි කේ. ඩී. කේ. ගේ අත දිගේ රූරා වැටෙන්න විය. මිල්ටන්, වික්ටර්, චන්ද්‍රකුමාර්, මර්වින්, විජය කුමාරතුංග සහ දයාරත්න පෙරේරා තමයි කේ. ඩී. කේ. ගේ සමීපතම හිතවතුන්ව උන්නේ. ඒ අයගෙන් මිල්ටන් කේ. ඩී. කේ ට පුදුමාකාර මිත්‍රත්වයක් ආදරයක් තිබුණු හිතවතෙක්. මිත්‍රත්වයේ ඝණකම කඳුළු කැට තුල විය. ඒ වෙලාවේ මිල්ටන් කේ. ඩී. කේ. ගේ අත්දෙක අල්ලාගෙන ඇඩුවා. මිල්ටන්ගේ ඇස් දෙකෙන් කඳුළු ගලා ගෙන ඇවිත් කේ. ඩී. කේ. ගේ අත්දෙක තෙමුණා. මිල්ටන්ගේ- කේ. ඩී. කේ. ගේ සොහොන් කොත් එක ළග හැදුවේ දෙදෙනාගේ මිත්‍රත්වය නිසයි. සමදරා එකදු මිල්ටන් සඳහා නිර්මාණය කල ගීතයක් වාණිජ අගයකට යටත් නොකිරීමේ ගුණය පදක්කම් පඩික්කම් ගානට වට්ටන අයටද පාඩම් වේ.

මිල්ටන්ට කේ. ඩී. කේ. ගීත සිය ගණනක් ලියා තියෙනවා. මිල්ටන් ගැයූ රණබර ඉඳුඳුණු සිතුවම් වෙලා - සිහිනෙන් ඔබ මට පෙනෙනව නම් - මා හා එදා ප්‍රිය සාදයේ-- සයුරු තෙරේදී - ණීමට මෙන් ඔහුට ද කඳුළ ඔබයි□ - උපුල් කොපුල් වෙහෙසී ඇතේ□ - රන්මසු නැහැ - ඉවුරු තලා ගංගා බැස යනවා - කුමාරියේ ඔබේ සිනා සඳළු තලාවේ - කෙසේ කියන්නද ඔබ මා අතහැර - නිරතුරු ඔබ ගැනම සිතන්නෙමි වැනි ගීත ගණනාවක්ම පද රචනා කේ. ඩී. කේ. ගේයි. මිල්ටන්ට ලියු අවසාන ගීතය ණීවීණා බිගු වීණා ගීතයත් සැබෑ අත්දැකීමක් ඇසුරෙන් ලියු ගීතයක් බව කේ. ඩී. කේ. කියලා තියෙනවා.

**රන් තැල්ලක් ගෙල බැන්ඳේ කවුරුදෝ**
**රන් මුදුවක් පැළඳෙෂව්වේ කවුරුදෝ**
**ඔබෙ අලුත් පෙම්වතා කවුරුදෝ**
**ඔබ බැඳි පෙම බිඳ දැමුවේ කවුරුදෝ...**

දක්ෂ, ජනප්‍රිය ගී පද රචකයකු මෙන්ම විද්‍යුත් මාධ්‍යවේදියකු ද ව සිටි කේ. ඩී. කේ. අපෙන් වියෝ වී අදට හරියටම දාහත් වසරකි. 1944 ජුනි මස 13දා උපන් කළුආරච්චිගේ දොන් කුමාරසිරි ධර්මවර්ධන හෙවත් කේ. ඩී. කේ ය.

43 වන පිටට